BCI BENEDICT XVI Catholic Institute of Higher Education

# ඇක්වයිනස් ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව

ඇක්වයිනස් උසස් අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන ඉහත සඳහන් ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව දැනට දිවයිනේ ඉහළින්ම පිළිගැනෙන උසස් පාඨමාලාවක් බවට පත්ව ඇත. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන උසස් වෘත්තීය පරීක්ෂණ සඳහා පූර්ව සුදුසුකමක් ලෙස මෙය පිළිගනු ලැබේ. මෙම වටිනා පාඨමාලාව දැන් ඔබට මීගමුව BCI ආයතනයේ දී හැදෑරිය හැක.

## 01. පාඨමාලා ව්‍යුහය

අ. පාඨමාලාව අදියර 4 කින් සමන්විත වේ.

1. පදනම් අදියර
2. ප්‍රාරම්භක අදියර
3. මධ්‍යම අදියර
4. අවසාන අදියර

ආ. විෂයයන් (පාඨමාලා අන්තර්ගතය)

1. ව්‍යාකරණ
2. අවබෝධය
3. රචනය
4. කථා කිරීමේ පුහුණුව
5. සම්භාව්‍ය ගද්‍ය පද්‍ය ග්‍රන්ථවල උද්ධෘත ඇසුරින් ඉංග්‍රීසි සාහිත්‍ය

## 02. ඇතුළු වීමේ සුදුසුකම්

1. **වයස් සීමාව:** වයස අවු. 16 ට වැඩි ඕනෑම ශිෂ්‍යයකු, පාසැල් හැර ගිය අයකු, රැකියාවක නියුතු හෝ රැකියාවක් අපේක්ෂාවෙන් පසුවන අයකුට මීට සම්බන්ධ විය හැකිය.
2. **අවම අධ්‍යාපන සුදුසුකම්:** අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ ඉංග්‍රීසි බස සමත් වී තිබීම.
3. **ඇතුලත් කර ගැනීමේ ලිඛිත පරීක්ෂණය**
   ආයතනය මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් පසු බඳවා ගැනීම සිදු කෙරේ. පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු මත ශිෂ්‍යයා ඇතුලත් වන පාඨමාලා අදියර තීරණය කෙරේ.

## 03. පාඨමාලා අවසන් පරීක්ෂණ

සෑම අදියකරම අවසානයේදී පැවැත්වෙන පරීක්ෂණයට පෙනී සිටිය හැක්කේ අවම වශයෙන් 80% ක් පන්ති වලට පැමිණි සිසුන්ට පමණි. එම පරීක්ෂණයෙන් සමත්වන සිසුහු ඊලඟ අදියරයට යාමට සුදුසුකම් ලබති. අදාළ පාඨමාලා ගාස්තු ගෙවීමෙන් පසු එම අදියරට යා හැකිය. සාර්ථක ලෙස අවසාන අදියර සමත්වන සිසුන් හට පමණක් ඇක්වයිනාස් ඉංග්‍රීසි ඩිප්ලෝමා සහතිකය පිරිනැමේ.

## 04. පාඨමාලා කාල සටහන සහ පන්ති පැවැත්වෙන දිනයන්

පහත සඳහන් අ, ආ, යන අවස්ථා 2න් ඕනෑම අවස්ථාවක පැවැත්වෙන පාඨමාලාවක් ශිෂ්‍යයාට තෝරා ගත හැකිය.

**අ. සතියේ දිනවල පෙරවරු පාඨමාලාව**
අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා පෙ.ව. 8.30 සිට ප.ව. 3.45 දක්වා (මාස 3 - එක් අදියරක් සඳහා)
බදාදා සහ සිකුරාදා පෙ.ව. 8.30 සිට ප.ව. 3.45 දක්වා (මාස 3 - එක් අදියරක් සඳහා)

**ආ. සති අන්ත පාඨමාලාව**
ඉරිදා පෙ.ව. 8.15 - ප.ව. 5.00 දක්වා
(මාස 06 - එක් අදියරක් සඳහා)

## 05. පාඨමාලා ගාස්තු

| | |
|---|---|
| ඇතුලත් කර ගැනීමේ විභාග ගාස්තුව | රු. 250/- |
| *පදනම්, ප්‍රාරම්භ සහ මධ්‍යම යන* | |
| එක් එක් අදියර සඳහා | රු. 13,000/- |
| අවසාන අදියර සඳහා | රු. 16,000/- |
| එක් එක් අදියර සඳහා නිබන්ධන ගාස්තු | රු. 750/- |

## 06. පාඨමාලාවට අයදුම් කළ හැකි ආකාරය

**අ.** www.bci.lk හරහා අප වෙබ් අඩවියට පිවිස online අයදුම්පත් පිරවිය හැකිය. අයදුම්පත් පිරවීම කල හැක්කේ වෙබ් අඩවිය ඔස්සේ පමණකි. ලිඛිත අයදුම්පත් බාර නොගන්නා අතර online අයදුම්පත් පිරවීමට සහය අවශ්‍ය නම් අප කාර්යාලයට පැමිණ ලියාපදිංචි විය හැක.

**ආ.** වෙබ් අඩවිය ඔස්සේ ලියාපදිංචි වීමෙන් පසු අප කාර්යාලයට පැමිණ අයදුම්පත් අංකය (Online Application Reference No) සහ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර ඇතුලත් කර ගැනීමේ විභාග ප්‍රවේශ පත්‍රය (Entrance Exam Admission Slip) ලබා ගත යුතුය.

**ඇ.** ඇතුලත් කර ගැනීමේ විභාගයට පෙනී සිටීම සඳහා අපේක්ෂකයා පැමිණිය යුත්තේ දෙන ලද පත්‍රිකාවේ සඳහන් දිනයේ පමණි. විභාගය සඳහා පැමිණෙන විට ජාතික හැඳුනුම්පත සහ විභාග ප්‍රවේශ පත්‍රය (Admission Slip) රැගෙන ආ යුතුය.

**ඈ.** ජාතික හැඳුනුම්පත් අංකය ඇතුල් කිරීමෙන් (www.bci.lk) වෙබ් අඩවිය ඔස්සේ ඇතුල් කර ගැනීමේ විභාගයේ ප්‍රතිඵල ඔබට දැනගත හැකිය.

**ඉ.** පාඨමාලාව සඳහා තේරුණු ශිෂ්‍ය ශිෂ්‍යාවන් පාඨමාලාවට අදල ගාස්තු බැංකුවට ගෙවා බැංකු ලදුපත ද අදල සෙසු ලේඛණ ද කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පාඨමාලාව ඇරඹීමට අවම වශයෙන් සතියකට පෙර තම පැමිණීම තහවුරු කර ඇතුලත් කර ගැනීමේ ලිපිය (Letter of Admission) ලබා ගත යුතුය.

## 07. කොන්දේසි

**අ.** ගාස්තු මුදල් ගෙවූ පසු පාඨමාලාවට නොපැමිණීම හෝ මගදී එය නතර කිරීම නිසා ගෙවූ මුදල් ආපසු ලබා ගත නොහැක.

**ආ.** පාඨමාලාවේ ස්වභාවය සහ කාලවකවානු ආදී කාරණා ගැන ලියාපදිංචි වීමට පෙර දැනුවත් වී සිටීමට අපේක්ෂකයා වගකීමෙන් බැඳී සිටියි.

**ඇ.** BCI ආයතනයට සම්බන්ධ වූ පසු සෑම ශිෂ්‍යයෙකුම, ශිෂ්‍යාවක්ම එහි විනය නීති මාලාව පිළිපැදීමට බැඳී සිටියි.


**විමසීම්**
**16 වන බෙනඩික්ට් කතෝලික උසස් අධ්‍යාපන ආයතනය**
**නො. 495, මිනුවන්ගොඩ පාර,**
**බෝලවලාන, මීගමුව.**

**031-222 4 422 / 031-222 4 333**
**0766 98 9797**
www.bci.lk
inquiries@bci.lk